## වත්තල ප්‍රාදේශීය සභාව
## ගම්පහ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 29 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාලය සඳහා මිලදී ගත් පොත් තොගයක වටිනාකම වූ රු.25,000 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පොදු සැපයුම් ණයහිමියන් රු.18,800 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සභාව විසින් 2015 වර්ෂයේදී රෝද 4 ට්‍රැක්ටර් 5 ක් සහ රෝද දෙකේ අත් ට්‍රැක්ටර් 2 ක් රු.7,320,485 කට මිලදී ගෙන තිබුණු අතර, පිළිවෙලින් මෙම ට්‍රැක්ටර් 07 ලියාපදිංචි කිරීම සඳහා රු.79,900 ක් සහ රු.13,960 ක් මිලදී ගත් ආයතනය වෙත ගෙවා තිබුණි. එම වියදම ප්‍රාග්ධනිත නොකර පුනරාවර්තන වියදමක් ලෙස කපා හැර තිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යාල පරිශ්‍රය සඳහා රු.419,599 කට මිලදී ගත් වායු සමීකරණ යන්ත්‍ර 05 ක් සවි කිරීම සඳහා රු.84,864 ක් වූ අමතර උපකරණ මිලදී ගැනීම ප්‍රාග්ධනගත නොකර පුනරාවර්තන වියදම් යටතේ කපා හැර තිබුණි.

#### 1.3.2 අසම්භාව්‍ය බැරකම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව නඩු 03 ක්ද, සභාව විසින් පවරා ඇති නඩු 2 ක් ඇතුළුව නඩු 5 ක් විභාග වෙමින් පැවතුණි. එම නඩු සඳහා නීතිඥ ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.304,650 ක් ගෙවා තිබුණි. මෙම නඩු තුළ සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම සහ වෙළඳ බලපත්‍ර ලබා නොදීම සම්බන්ධයෙන් වූ නඩු තිබූ අතර, එම වගකීම් සම්බන්ධයෙන් අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවලින් පෙන්නුම් කර නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.120,101,222 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.28,449,889 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.60,537,699 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

2015 ජූනි 08 දින වටිනාකම රු.10,000,000 ක් වූ ස්ථාවර තැන්පතු සහ 2013 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.2,669,150 ක් වූ සත් දින තැන්පතු 4 ක් ලෙස මුළු එකතුව රු.12,669,150 ක් වූ සත් දින ස්ථාවර තැන්පත් දිගු කාලීන ස්ථාවර තැන්පත්වල ආයෝජනය කලේනම් වඩාත් ආර්ථිකමය හා ඵලදායි බව නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත සඳහන් දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ලැබීම (වර්ෂයට අදාළව) ලැබීම් | දෙසැම්බර් දිනට සමුච්චිත හිඟ ශේෂය |
|---|---|---|---|
| | රු.000’ | රු.000’ | රු.000’ |
| වරිපනම් හා බදු | 87,098 | 76,603 | 96,470 |
| බදු කුලී | 5,841 | 5,380 | 7,419 |
| වෙළඳ බලපත්‍ර | 2,266 | 2,448 | 785 |

2015 වර්ෂය තුළ ඉලක්කගත කළ ප්‍රධාන ආදායම් වූ වරිපනම් බදු, වෙළඳ ස්ථාන කුලී හා බදුකර කුලී යන බදු ඉලක්ක ගත ප්‍රමාණය එකතුකර ගැනීමට සහ හිග ආදායම් අයකර ගැනීමටද සභාව අපොහොසත්වී තිබුණි.

2.3.2 <u>වරිපනම් හා බදු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයෙන් පසු තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දේපල තක්සේරුවක් කර නොතිබුණි. උප කාර්යාල තුනෙහි මුළු වරිපනම් ඒකක ප්‍රමාණය 62179 ක් වූ අතර, ආදායම් පරිපාලක විසින් දේපල 103 ක තාවකාලික ප්‍රතිශෝධනයක් කර තිබුණි.

(ආ) නෛතිකව අයකර ගත නොහැකි හැඳල උප කාර්යාලයට අයත් 2008 වර්ෂයේදී හඳුනාගත් වරිපනම් ඒකක 1276 ක හිඟ වරිපනම් බදු වටිනාකම රු.917,747 ක් ලේඛනවලින් ඉවත්කර ගැනීමට අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට රු.96,010,102 ක්වූ හිඟ වරිපනම් ආදායම තුළ වසර 1 සිට වසර 10 දක්වා රු.66,612,688 ක මුදලක් ඇතුළත් වූ අතර, මෙම මුදල් අයකර ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි .

(ඈ) වසර එකේ සිට වසර 10 දක්වා රු.66,612,668 ක් වූ හිඟ වරිපනම් ආදායමින් සියයට 61 ක් හැඳල උප කාර්යාලයටද සියයට 24 ක් වැලිසර උප කාර්යාලයටද සියයට 16 ක් පමුණුගම උප කාර්යාලයටද අයත් විය.

2.3.3 <u>ව්‍යාපාර බදු</u>

(අ) 2015 දෙසැම්බර් 31 දිනට වසර 05 ඉක්මවන ලද අයකර නොගත් ව්‍යාපාර බදු වටිනාකම රු.243,270 ක් වූ අතර මෙයින් වසර 10 කට වඩා පැරණි රු.204,350 ක හිඟ මුදල ලේඛනවලින් ඉවත් කිරීමට අනුමැතියට යොමුකර ඇතත් අනුමැතිය ලැබී නොතිබුණි.

(ආ) හැඳල උප කාර්යාලයේ වසර 5 ට වැඩි ව්‍යාපාර බදු හිඟ ශේෂය රු.702,460 ක්ද, වසර 1 ත් 3 ත් අතර හිඟ හිටි ශේෂය රු.104,000 ක්ද විය.

2.3.4 <u>බදුකුලී</u>

හැඳල උප කාර්යාලයේ වෙළඳ සංකීර්ණයෙන් 2015 දෙසැම්බර් 31 දිනට හිඟ කුලී ශේෂය රු.6,618,930 ක් වූ අතර එම ශේෂය තුළ වසර 1 ත් 3 ත් අතර ශේෂය රු.1,009,838 ක්ද, වසර 3ත් 5 ත් අතර ශේෂය රු.3,787,673 ක්ද වසර 5 ට වැඩි ශේෂය රු.919,496 ක් ද විය.

2.3.5 <u>වෙළඳ බලපත්‍ර</u>

2015 දෙසැම්බර් 31 දිනට වෙළඳ බලපත්‍ර හිඟය රු.784,805 ක් වූ අතර එම ශේෂය තුළ වසර 10 කට වඩා පැරණි රු.406,000 ක හිඟ මුදල් ලේඛනවලින් ඉවත් කිරීම සඳහා අනුමැතියට යොමුකර තිබුණි.

2.3.6 **<u>වෙනත් ආදායම්</u>**

(අ) හැඳල උප කාර්යාලයේ සම්ප්‍රේෂණ කුළුණෙන් 2015 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති රු.74,407 ක් වූ හිඟ ශේෂය 2013 වසරේ සිට පැවත එන අතර එය අය කර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(ආ)** 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරී පනතට අදාළ වන ප්‍රදේශවල ඇති දුරකථන /විදුලි සංදේශ කුළුණුවලින් ගාස්තු අයකිරීම් කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රදේශවල දුරකථන /විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු අයකර තිබුණේ වාර්ෂික වටිනාකමින් සියයට 5 කි.

**3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**3.1 <u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් අනුව වටිනාකම හඳුනාගත නොහැකි වසර ගණනාවක් පැරණි සභාව සතු වාහන 07 ක් අභාවිතව තිබූ අතර, මේවා අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර වසරින් වසර දිරාපත් වෙමින් පැවතුණි. මේ පිළිබඳව මීට පෙර විගණන විමසුම්වලින්ද පෙන්වා තිබූ අතර, යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ සහාය ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බවට 2014 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් නිර්දේශ කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) හැඳල උප කාර්යාලයට අයත් කෙරවලපිටිය වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල් 13 ක් 2012 වර්ෂයේ සිට වසා දමා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලද කෑෂ කැබ් රථය, ටිපර් රථය හා බැකෝ ලෝඩරයේ අයිතිය විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 30 දින විටත් සභාවට පවරාගෙන නොතිබූ අතර, කෑෂ කැබ් රථය ඌන උපයෝජිතව පැවතුණි.

(ඈ) 2015 ජූලි 02 දින සභාවට පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ බැකෝ යන්ත්‍රයක් විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 30 දිනය වන විටත් නිශ්කාර්යව පැවතුණි.

3.2 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර සිංහ සමාජයෙන් පරිත්‍යාගයක් ලෙස 2000 වසරේදී ලද රු.2,158,358 ක් වටිනා ගිනි නිවන රථය 2003 නොවැම්බර් 05 දින වැලිසර නාවික හමුදාවට අවිධිමත්ව පවරා දී තිබුණු අතර

විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 30 දින වන විටත් මෙය නැවත සභාවට ලබා ගෙන නොතිබුණි. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ ලියාපදිංචිය පිළිබඳ ජාලගත පරීක්ෂාවේදී එම අංකයට අදාළ වාහනය කැලණිය විශ්ව විද්‍යාලයට අයත්වූවක් බව නාවික හමුදාපතිවරයා විසින් නැවත සභාවට දැනුම්දී තිබුණු අතර, ගිනි නිවන රථය කුමන තත්ත්වයේ කුමන ස්ථානයක පවතී දැයි තහවුරු කර ගත නොහැකි විය.

(ආ) මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රදේශීය සභාවට ලබා දෙන ලද මිට්සුබිෂි කැබ් රථය 1995 ජූලි 13 දින යුද හමුදාවට රැගෙන ගොස් 2008 පෙබරවාරි 02 දින පාවිච්චියට නුසුදුසු තත්ත්වයෙන් සභාව වෙත භාරදී තිබුණි. මෙම රථයේ අයිතිය සභාවට පවරාගෙන නොතිබූ අතර සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කමක් ලෙස පෙන්වා නොතිබුණි. 2012 ඔක්තෝබර් 06 දින පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් මෙම රථය අළුත්වැඩියාවට විශාල වියදමක් දැරීමට සභාවට සිදුවන බැවින් රු.125,000 ක තක්සේරු වටිනාකමට අපහරණය කිරීමටද 2014 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ මෙය වෙන්දේසි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට නිර්දේශ කර තිබුණද, විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 30 දින වන විටත් ඉහත නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දින සියයේ විශේෂ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.34,000,000 ක ව්‍යාපෘති 35 ක් අනුමත වී තිබුණද එයින් ව්‍යාපෘති 2 ක් අවලංගු විය.වැඩ අවසන්වූ ව්‍යාපෘති 23 ක මුදල් සභාවට ලැබී තිබුණි. ආරම්භක අවස්ථාවේ කර්මාන්ත 8 ක් පැවති අතර රු.2,000,000 ක් වටිනා ව්‍යාපෘති 2 ක් සඳහා ගිවිසුම් ගතව නොතිබුණි.

(ආ) දොරින් දොරට ගමින් ගමට ග්‍රාමීය මාර්ග,ග්‍රාමීය පාලම් නවීකරණය සඳහා වූ වැඩ සටහන යටතේ 2014 වර්ෂයේදී අනුමත වී 2015 වර්ෂය සඳහා අවිච්ඡේද කර තිබුණු ව්‍යාපෘති 05ක් වෙනුවෙන් රු.2,577,500 ක් ප්‍රතිපූර්ණයට යවා තිබුණද, 2015 දෙසැම්බර් 31 වන විටත් ඒවා ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

(ඇ) පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් 16 දින ගැල්වනයිස් බට 340 ක් සභාවට ලබාදී තිබියදී 2015 ජනවාරි 12 දින ගැල්වනයිස් බට 200 ක් රු.465,000 කට මිලදීගෙන තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට භෞතිකව සභාව තුළ නොපවතින වටිනාකම වූ රු.2,273,896 ක්වූ වාහන 13 ක් සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩල පත්කර නිර්දේශ ලබාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වෙළඳ සංකීර්ණයේ උත්සව ශාලාව සඳහා හිඟ කුලිය වෙනුවෙන් ලද රු.974,800 ක චෙක්පත 2009 ජූනි 09 දින අගරු වී ඇති අතර ඒ සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2016 මාර්තු 31 දින වන විටත් නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ආ) වත්තල බල ප්‍රදේශය තුළ මාර්ග 1808 ක් හැඳල, වැලිසර, පමුණුගම වශයෙන් ඉන්වෙන්ට්‍රිගත වී තිබුණි. මෙම පාරවල් බොරළු, කොන්ක්‍රීට්, තාර, යන්න වර්ග කර හඳුනාගෙන නොතිබූ අතර, 2014-2015 වර්ෂවල මාර්ග ලේඛනයද යාවත්කාලීන කර නොතිබුණි. පාරවල් ගැසට් කිරීමට යෝජනා 2013 නොවැම්බර් 06 දින සම්මත කර ගෙන ඇතත් පමුණුගම උප කාර්යාලයට අයත් බල ප්‍රදේශයේ ගැසට් කිරීමට නියමිත ග්‍රාම සේවා වසම් 13 ක මාර්ග 524 ක් ගැසට් කර පවරා ගෙන නොතිබුණි.

## 3.5 සන අපද්‍රව්‍ය කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේදී කසල අපහරණය වෙනුවෙන් රු.170,040,180ක මුදලක් ගෙවා තිබුණු අතර පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුළින් දිනකට කසල ටොන් 15-16 ත් අතර ප්‍රමාණයක් එකතු කරනු ලැබුවත් ජීවවායු ඒකකයට බැහැර කර තිබුණේ කසල ටොන් 5-6 ක ප්‍රමාණයක් පමණි.

(ආ) 2002 වර්ෂයේදී නර්ඩ් ආයතනය විසින් ටොන් 8 ක ධාරිතාවක් ඇතිව ඉදිකරන ලද ජීවවායු නිපදවීමේ ව්‍යාපෘතිය දීර්ඝ කාලයක සිට අක්‍රීයව පැවතිණි.

(ඇ) සභාවේ ලේකම් විසින් නගර සභා අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව මැලේසියාවේ වැඩමුළුවකට සහභාගී වී ඒ සඳහා සභා අරමුදලින් රු.130,000 ක මුදලක් වැයකර තිබූ අතර, ලබාගත් දැනුම, කුසලතා හා ආකල්ප තුළින් ආයතනයේ මෙහෙවරට දායකත්වයක් ලැබුණේද යන්න තහවුරු වී නොතිබුණි.

(ඈ) අවරකොටුව හැඳල ඉඩමකට ට්‍රැක්ටර් ලෝඩ් 06 ක් අවසන් බැහැර කිරීම කරනු ලබන අතර, එම ඉඩම පිහිටා තිබෙන්නේ ගම්මානයක වන බැවින් මහජන විරෝධතා මැද මෙම බැහැර කිරීම සිදුවන බව නිරීක්ෂණය විය.තවද එහි කසළ පොහොර කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ඉ) 2011 ජූලි 05 දිනැති අංක 1713/11 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයේ IV (අ) වැනි කොටස මගින් සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පනවා ඇති අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව සභාව විසින් ඉටුකළ යුතු කාර්යයන් සිදුකර නොතිබුණි.

# 4. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය